මාධ්‍ය නිවේදන අංක 05

# මැතිවරණ කොමිෂන් සභාව

2021.01.29 දින රැස් වූ මැතිවරණ කොමිෂන් සභාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට පත්කොට ඇති කමිටුව වෙත මතු දැක්වෙන යෝජනා ඉදිරිපත් කිරීමට තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

- පුරවැසියාගේ ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය සෘජුවම මූලික අයිතිවාසිකමක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැනටමත් සඳහන්ව ඇති ඡන්ද විමසීම් වන්නේ ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය හා ජනමත විචාරණය පමණක් වන නිසා ඊට අමතරව පළාත් සභා හා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ද එම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම.

- ඡන්ද විමසීමක් සඳහා මැතිවරණයකට තරග කරනු ලබන සෑම අපේක්ෂකයකු විසින්ම එකී මැතිවරණය සඳහා ඔහු හෝ ඇය විසින් සිදු කරන ලද සැබෑ වියදම හා ආදායම් මූලාශ්‍ර ඇතුළත් ප්‍රකාශනයක් ඡන්ද විමසීමක් අවසානයේ ප්‍රතිඵල නිකුත් කොට දින 30ක් ඇතුළත මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම අනිවාර්යය කිරීම හා එය ප්‍රසිද්ධියට පත් කිරීමට කොමිෂන් සභාවට බලය පැවරීමත් එසේ ඉදිරිපත් කරනු ලබන වියදම් වාර්තාව නියමිත කාලය තුළ ලබා නොදීම හෝ සාවද්‍ය කරුණු ඇතුළත් කොට තිබීම හෝ දෝෂ සහිත නම් ඔහුගේ/ඇයගේ මන්ත්‍රී ධුරය/සභික ධුරය අහෝසි කිරීම හා පරාජිත අපේක්ෂකයකු නම් එම ක්‍රියාව මැතිවරණ වරදක් සේ සලකා කටයුතු කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාව වෙත ලබා දීම.

- පාර්ලිමේන්තුවට තේරීපත් වූ යම් මන්ත්‍රීවරයකු ස්වකීය ධුර කාලයේ පළමු වර්ෂ 02 තුළ යම් රෝගී තත්ත්වයක් හෝ වෙනත් සුවිශේෂී සාධාරණ හේතුවකින් තොරව එම කාලය තුළ පවත්වනු ලැබූ මුළු පාර්ලිමේන්තු සභා රැස්වීම් දින ගණනින් අවම වශයෙන් 1/3කට වත් නොපැමිණියහොත් එම මන්ත්‍රී ධුරය අහෝසි කිරීම.

- ජනමත විචාරණයක දී දැනට පවතින්නේ එක් නිශ්චිත කරුණක් පිළිබඳව ජනමතය විමසීම පමණක් වන නිසා යම් පනතක යම් නිශ්චිත කාර්යයන් කිහිපයක් සම්බන්ධයෙන් විධානයක් හෝ විධාන කිහිපයක් සඳහා ජනතා අදහස් ලබා ගත හැකි වන පරිදි ඊට අදාළව පවත්නා වගන්ති සංශෝධනය කිරීම.

- පාර්ලිමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරයකු හෝ සභිකයකු විසින් සිදු කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් අධිකරණයක් මගින් වරදකරුවකු කළ පසු එම මන්ත්‍රීවරයා හෝ සභිකයා එම මන්ත්‍රී ධුරය හෝ සභික ධුරය දැරීමට නුසුදුස්සකු වන්නේ නම් එම අවස්ථාව විමර්ශනය කොට මන්ත්‍රී ධුරයෙන් හෝ සභික ධුරයෙන් එම තැනැත්තා ඉවත් කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට බලය පැවරීම.

- යම් දේශපාලන පක්ෂයක් විසින් පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ඉදිරිපත් කරනු ලබන නාම යෝජනා පත්‍රය සමග ජාතික ලැයිස්තුව සඳහා ද නාම යෝජනා පත්‍රයක් ලබා දිය යුතු බවත් එම ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුර ඡන්ද විමසීමෙන් දින 07 ක් ඇතුළත නම් කිරීම සිදු නොකරන්නේ නම් මැතිවරණ කොමිෂන් සභාව වෙත භාර දී ඇති ජාතික ලැයිස්තු නාම යෝජනා පත්‍රයේ නම් සඳහන් ප්‍රමුඛතා අනුපිළිවෙලට මන්ත්‍රී ධුරයන් ගැසට් පත්‍රයේ පළ කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට බලය ලබා දීම.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින්ම තරුණ හා කාන්තා නියෝජනයේ යම් ප්‍රතිශතයක් පාර්ලිමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන අපේක්ෂක නාම යෝජනා සඳහා ඇතුළත් කිරීමට අදාළ විධි විධාන සැලසීම.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2021.01.29